1.1.2 පරිගණකයේ ලාක්ෂණික ගුණාංග

පෙළ පොතේ 02,03 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. පරිගණකයේ ලාක්ෂණික ගුණාංග යනු කුමක්දැයි නිවැරදිව හඳුනාගන්න.

(01) හිස්තැනට සුදුසු වචනය යොදන්න

(නිරවද්‍යතාව, විශ්වසනීයතාව, වේගය හා කාර්යක්ෂමතාව, බුද්ධිමය බව, ආචයන ධාරිතාව, පිරිවැය, නියත බව)

(a) පරිගණකයට ලබාදෙන උපදෙස් අනුව එයට කටයුතු කළ හැකිවීම - .....

(b) විශාල දත්ත ප්‍රමාණයක් ගබඩා කර තබා ගතහැකි වීම - .....

(c) නිවැරදි දත්ත හා උපදෙස් ලබාදුන් විට නිවැරදි තොරතුර ලබාදිය හැකිවීම - .....

(d) පරිගණකයට ලබාදෙන ඕනෑම කාර්යයක් ඉතා අඩු කාලයකින් නිම කිරීම - .....

(e) පරිගණකය තුළ සිදුවන ක්‍රියාව හා ලබාදෙන තොරතුරු පිළිබඳ විශ්වාසය - .....

(f) මූලික වියදම ඉහළ වුවත් නඩත්තුව සඳහා යන වියදම අඩුවීම -.....

(g) පරිගණකයට ලබාදෙන ආදානය එකම විට ලැබෙන ප්‍රතිදානය සමානය - .....